# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 7,932 — 1932ක්වූ ජූනි මස 24 වෙනි දිනවූ සිකුරාදා.


## Part IV. — හතරවෙනි කාණ්ඩය.

### ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම.

**Kandy No. 203.**—මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වම් 1932ක්වූ අගෝස්තු මස 8වෙනි දිනවූ සඳුදා පෙරවරු 9ට යගල්තැන්නේ සෙකෝලයේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ යටිනුවර කෝරළයේ පිහිටා තිබෙන බිම්කැබලි 37ක්.

මුල් සිතියමේ නො. 8,316. ගම—යටපලාතකෝරළේ යගල්තැන්න.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අයිතිකමකියන්නා | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|
| 1 | විගුල්වෙල්පදුරේවත්ත .. | — .. | ආණ්ඩුව සහ ඒ. ජමල්දීන් සහ කේ. හව්වා උම්මා | හේන් .. | 2 1 18 | 20 |
| 2 | බවගල්ලෙහේනෙවත්ත නොහොත් කළුගලහේනෙවත්ත | — .. | ආණ්ඩුව සහ බී. ජමල්දීන් ලෙබ්බෙ සහ මහමදු ලෙබ්බෙ | එම .. | 1 0 12 | 20 |
| 3 | බවගලලෙහේනෙපතන නොහොත් කළුගලහේනෙපතන | — .. | එම .. .. | පතන .. | 0 0 27 | 20 |
| 4 | කළුගලහේනෙවත්ත .. | — .. | ආණ්ඩුව සහ ඒ. ඉසුබු ලෙබ්බෙ .. | හේන් .. | 1 0 35 | 20 |
| 7 | වටපතන නොහොත් අලවලගහමුදුනෙවත්ත | — .. | ආණ්ඩුව සහ ඒ. ඒ. ආදම් ලෙබ්බෙ, ඇන්. එච්. මොහම්මදු ලෙබ්බෙ සහ බී. ඇම්. ජමල්දීන් ලෙබ්බෙ | එම .. | 2 0 7 | 20 |
| 8 | එම .. | — .. | ආණ්ඩුව සහ උක්කුවා මහදූරයා .. | පතන .. | 1 0 28 | 10 |
| 9 | එම .. | — .. | එම සහ පුසුම්බා සහ බිංගිරී .. | හේන් සහ තවත් | 2 2 19 | 10 |
| 10 | කුරුකුදෙහේනේවත්ත .. | — .. | එම කේ. මොහම්මදු ලෙබ්බෙ සහ කේ. හවුවා | හේන් .. | 1 1 1 | 20 |
| 11 | ඉහලගෙදරහේනෙවත්ත .. | — .. | ආණ්ඩුව සහ කේ. ඉසුබු ලෙබ්බෙ .. | එම .. | 1 3 12 | 20 |
| 12 | හනෙකුඹුර .. | — .. | එම සහ උදුමා ලෙබ්බෙ .. | කුඹුර .. | 0 0 13 | 20 |
| 13 | හනෙකුඹුරහේනෙ වත්ත | — .. | එම සහ කේ. උදුමා ලෙබ්බෙ, ආර්. පුසුම්බා සහ හාදිරිස් | හේන් .. | 3 3 33 | 20 |
| 14 | ගනෙකුඹුර .. | — .. | එම සහ කේ. උදුමා ලෙබ්බෙ .. | කුඹුර .. | 0 0 28 | 20 |
| 16 | වෙඩික්කාරගෙදරවත්ත .. | — .. | එම .. .. | හේන් .. | 1 3 27 | 20 |
| 17 | හිරිපිටියගෙදනියෙවත්ත .. | — .. | ආණ්ඩුව, ඒ. කාසිම් ලෙබ්බෙ සහ ඒ. සාමි ලෙබ්බෙ | එම .. | 0 1 3 | 20 |
| 18 | මොරගහබිඩිනෙහේනෙවත්ත | — .. | එම සහ පී. බමරු ලෙබ්බෙ .. | එම .. | 2 3 33 | 20 |
| 19 | වෙඩික්කාර ගෙදරහේනෙවත්ත | — .. | එම කේ. කාසිම් ලෙබ්බෙ සහ ඇන්. ආදම් ලෙබ්බෙ | එම .. | 0 3 26 | 20 |
| 20 | වෙඩික්කාරගෙදරහේන .. | — .. | එම සහ බී. ඇම්. මොහම්මදු ලෙබ්බෙ | පතන .. | 0 3 25 | 20 |
| 21 | අලවැලගහමුදුනෙවත්ත .. | — .. | ආණ්ඩුව, ඒ. අබ්දුල්රහිමාන් ලෙබ්බෙ සහ බී. ඇම්. මොහම්මදු ලෙබ්බෙ | හේන් .. | 0 3 8 | 20 |
| 22 | එම .. | — .. | එම .. | අළුත් එළිකිරීම | 0 0 6 | 20 |
| 23 | මැදගැම්මැද්දෙවත්ත .. | — .. | ආණ්ඩුව, ඇම්. පුසුම්බා, කේ. උදුමා ලෙබ්බෙ සහ තවත් | පතන .. | 0 3 17 | 20 |

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අයිතිකම් කියන්නෝ. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|
| 24 | මැදගැම්මැද්දෙවත්ත | — | ආණ්ඩුව, පී. මොහම්මදු ලෙබ්බෙ, කේ. ආදම් ලෙබ්බෙ, පී. ඇම්. අබ්දුල් කාදර් ලෙබ්බෙ, ඇම්. මැනිකා, පුසුම්බා සහ සුන්දරි | හේන් | 2 1 33 | 20 |
| 25 | මැදගැම්මැද්දෙකුඹුර | — | ආණ්ඩුව, ඇම්. පුසුම්බා සහ තවත් .. | කුඹුර | 0 2 2 | 20 |
| 26 | මැදගැම්මැද්දෙවත්ත | — | නො. 24හි හිමිකම්කාරයන්ගේ උරුමක්කාරයෝමය | හේන් | 0 0 36 | 20 |
| 27 | කළුගලහේනවත්ත | — | ආණ්ඩුව සහ බී. ඇම්. අබ්දුල් කාදර් ලෙබ්බෙ | එම | 0 1 32 | 20 |
| 28 | එම | — | එම | එම | 1 0 18 | 20 |
| 29 | කමත | — | එම සහ මයිමුන්නාච්චි | කමත | 0 0 16 | 20 |
| 30 | විගුල්පදුරේවත්ත | — | ආණ්ඩුව, බී. ඇම්. මහම්මදු ලෙබ්බෙ සහ ජෙමාල්බීන් | හේන් | 0 2 9 | 20 |
| 30A | එම | — | ආණ්ඩුව සහ බී. ඇම්. අබ්දුල් කාදර් | එම | 0 1 6 | 20 |
| 31 | යමන්ගෙදරහේන නොහොත් කළුගලහේනවත්ත | — | ආණ්ඩුව සහ බී. ඇම්. ජෙමාල්බීන් ලෙබ්බෙ සහ අබ්දුල් කාදර් ලෙබ්බෙ | එම | 1 3 10 | 20 |
| 33 | කළුගලහේනවත්ත | — | එම පාතුම්මා සහ මොහමදු ලෙබ්බෙ | එම | 0 2 8 | 20 |
| 33A | එම | — | ආණ්ඩුව සහ හොරතලී සහ බිලින්ද | එම | 0 1 2 | 10 |
| 34 | මම | — | ආණ්ඩුව, පාතුම්මා, ජෙමාල්බීය සහ මහම්මදු ලෙබ්බෙ | එම | 0 2 21 | 20 |
| 34A | එම | — | ආණ්ඩුව, එච්. හොරතලී සහ බිලින්ද | එම | 0 2 9 | 10 |
| 35 | කළුගලදෙනියකුඹුර | — | ආණ්ඩුව සහ එච්. පසුබාගේ දරුවෝ | කුඹුර | 0 0 38 | 10 |
| 36 | මිනාවේහේනවත්ත | — | ආණ්ඩුව සහ එච්. මැනිකා | හේන් | 0 1 25 | 10 |
| 37 | එම | — | එම එච්. පුසුබා, හම්වා සහ හොරතලාගේ සහ බෝදියාගේ උරුමක්කාරයෝ | එම | 1 2 0 | 10 |
| 38 | මානික්කවත්ත නොහොත් මිනාවේහේන | — | ආණ්ඩුව සහ හෙ?ල්නාහාමි | එම | 0 2 20 | 10 |

මෙම ඉඩම් සම්බන්ධව වැඩිදුර කාරණා මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ මූල් සිතියම් සර්වෙයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගන්ට පුළුවන.

මේ 1932ක්වූ ජූනි මස 21 වෙනි දින කොළඹ ඉඩම් පිළිබද කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. වී. බ්‍රෞන්,
ඉඩම් පිළිබද කොමසාරිස් උන්නාන්සේ විසින්.

---

**Kegalla No. 39.**—සබරගමු දිසාවේ කෑගල්ල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට මේ 1932ක්වූ අගෝස්තු මස 2වෙනි දිනවූ සඳුදා පෙරවරු 10ට කිතුල්ගල තානායමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යොදනවා ඇත. සබරගමු දිසාවේ කෑගල්ල දිස්ත්‍රික්කයේ කෝරලතුනේ සහ පාතබුලත්ගම පිහිටා තිබෙන බිම්කැබලි 41ක්.

මූල් සිතියමේ නො. 3,845. ගම—වැලිහෙලතැන්න.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 3 | මඩොල්මූකලානේවතත | — | අවුරුදු 17ක් පමණ වයසැති පොල් ඉඩම | 0 2 24 | 135 |
| | මූල් සිතියමේ නො. 4,053. ගම—ගෝනාගමුව. | | | | |
| 1 | මඩොල්මූකලානේ හුනුගලමූලවත්ත නොහොත් මඩොල්මූකලානේවත්ත | ඩබ්ලිව්. පුංචිරාල | ඉල්ලුම්කරු විසින් අල්ලාගන්නාලද අවුරුදු 2 සිට 8 දක්වා පමණ වයසැති පුවක් සහ කොස් සහ කෙසෙල් ඇති ඉඩම | 0 1 21 | 60* |
| 2 | එම | එම | එම රිංගන ඇලදිගේ වෙන්කර තිබේ | 0 2 5 | —† |
| 3 | මඩොල්මූකලානේ හුනුගලමූලවත්ත | — | ඩබ්ලිව්. පුංචිරාල විසින් අල්ලාගන්නාලද අවුරුදු 5 සිට 15 දක්වා පමණ වයසැති රබර්, කොස් පුවක් ඇති රින්ගනඇල දිගේ වෙන්කර තිබෙන ඉඩම | 1 2 7 | —† |
| 4 | මඩොල්මූකලාන | — | මූකලාන | 0 2 6 | 60 |
| | මූල් සිතියමේ නො. 3,870. | | | | |
| 1 | එම | — | අඹිපාර දිගේ වෙන්කර තිබෙන මූකලාන | 0 0 4 | 60 |
| | මූල් සිතියමේ නො. 4,053. | | | | |
| 5 | මඩොල්මූකලානේ හුනුගලමූලවත්ත | ඩබ්ලිව්. පුංචිරාල | ඉල්ලුම්කරු විසින් අල්ලාගන්නාලද අවුරුදු 5 සිට 15 දක්වා පමණ වයසැති රබර්, පුවක්, පොල්, කොස් සහ ගෙවල් දෙකක්ද තාවකාලික මැටි ගෙයක්ද ඇති ඉඩම | 4 0 21 | 80* |
| 6 | එම | — | ඩබ්ලිව්. පුංචිරාල විසින් අල්ලාගන්නාලද අවුරුදු සිට 10 දක්වා පමණ වයසැති පුවක්, පොල්, කොස්, කෙසෙල් පඳුරු සහ ගෙයක්ද ඇති ඉඩම, ගම්සභාපාරට වෙන්කර තිබේ | 0 2 21 | —† |
| 7 | එම | — | එම අය විසින් අල්ලාගන්නාලද අවුරුදු 3 සිට 6 දක්වා පමණ වයසැති පුවක්, දෙල් සහ කෙසෙල් පඳුරුද ඇති ඉඩම, ගම්සභාපාරට වෙන්කර තිබේ | 0 0 15 | —† |
| 8 | එම | ඩබ්ලිව්. පුංචිරාල | එම අය විසින් අල්ලාගන්නාලද අවුරුදු 5 සිට 15 දක්වා පමණ වයසැති පොල්, කොස් සහ කෙසෙල් පඳුරුද ඇති ඉඩම | 1 0 14 | 60* |
| 9 | මඩොල්මූකලානේ හුනුගලමූලවත්ත | — | එම අය විසින් අල්ලාගන්නාලද අවුරුදු 3 සිට 15 දක්වා වයසැති කිතුල්, පොල්, පුවක් සහ කෙසෙල් පඳුරුද ඇති ඉඩම, රිංගන ඇල දිගේ වෙන්කර තිබේ | 1 0 15 | —† |

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| | | | මුල් සිතියමේ නො. 4,065. ගම—වැලිහෙලතැන්න. | | | | |
| 1 | වත්තේහේන නොහොත් වත්තේහේනේ මූකලාන | — | .. මූකලාන .. .. .. | 2 | 2 | 14 | —† |
| 2 | මුගුනුවැල්ඇටකුඹුර .. | — | .. කේ. දවිත්සිංඤෝ, කේ. පොඩිසිංඤෝ, කේ. ඩිංගිරිමැණිකා, කේ. කිරිගෝරිස්, කේ. බුළපිසිංඤෝ, කේ. ඩිංගිරි මහත්මයා සහ කේ. පුංචිමැණිකේ විසින් අල්ලාගත්තාලද කුඹුර | 0 | 0 | 16 | 160* |
| 3 | එම .. | — | .. එම .. .. | 0 | 0 | 15 | 160* |
| 4 | කුඹුරුගාවාවත්ත .. | — | .. ඩබ්ලිව්. ජේම්ස් අප්පුහාමි, කේ. දවිත්සිංඤෝ, කේ. පොඩිසිංඤෝ, කේ. ඩිංගිරිමැණිකා, කේ. කිරිගෝරිස්, කේ. බුළපිසිංඤෝ, කේ. ඩිංගිරි මහත්මයා සහ කේ. පුංචිමැණිකේ විසින් අල්ලාගත්තාලද අවුරුදු 10 සිට 30 දක්වා වයසැති පුවක්, පොල් සහ කොස් ඇති ඉඩම | 0 | 1 | 6 | 110* |
| 5 | ඉරමැල්ලබොඩවත්ත .. | — | .. ඩබ්ලිව්. රත්එතනා, ඩබ්ලිව්. හාමිනෝනා, ඩබ්ලිව්. පොඩිසිංඤෝ සහ දෙන් සිංඤෝනිස් අප්පුහාමි විසින් අල්ලාගත්තාලද අවුරුද්දක් පමණ වයසැති කෙසෙල් පඳුරු ඇති ඉඩම | 0 | 0 | 9 | 110* |
| 6 | එම .. | — | .. එම අය විසින් අල්ලාගත්තාලද අවුරුදු 2 සිට 5 දක්වා පමණ වයසැති පොල්, පුවක්, කොස් සහ කෙසෙල් පඳුරුද ඇති ඉඩම | 0 | 0 | 13 | 110* |
| 7 | වත්තේහේන .. | — | .. හේන .. .. .. | 11 | 0 | 0 | —† |
| | | | මුල් සිතියමේ නො. 4,076. ගම—ගනේපල්ල. | | | | |
| 1 | උස්සාගලගේවත්ත .. | — | .. බදුල්ලවල කේ. පුංචිඅප්පුහාමි විසින් අල්ලාගත්තාලද අවුරුදු 15ක් පමණ වයසැති කොස් ගහක් සහ අවුරුදු 5ක් පමණ වයසැති රබර්ගස් 22ක්ද ඇති ඉඩම | 0 | 0 | 32 | 60* |
| 2 | එම .. | — | .. බදුල්ලවල කේ. පුංචිඅප්පුහාමිට බදුදී තිබෙන අවුරුදු 15ක් පමණ වයසැති කොස්ගහක්ද, අවුරුදු 5ක් පමණ වයසැති පුවක්ගහක්ද ඇති ඉඩම, ගම්සභාපාර දිගේ වෙන්කර තිබේ | 0 | 0 | 7 | —† |
| 3 | ගනේපල්ලවත්ත .. | — | .. ගනේපල්ලවත්තට බදුදී තිබෙන අවුරුදු 25ක් පමණ වයසැති රබර් ඇති ගම්සභාපාර දිගේ වෙන්කර තිබෙන ඉඩම | 0 | 0 | 10 | —† |
| 4 | එම .. | — | .. ගනේපල්ලවත්ත අයිතිකාරයන් විසින් අල්ලාගත්තාලද අවුරුදු 25ක් පමණ වයසැති රබර්ද, අවුරුදු 2 සිට 5 දක්වා පමණ වයසැති පුවක් ගස් 8ක්ද, අවුරුදු 15ක් පමණ වයසැති කොස් ගහක්ද ඇති ඉඩම | 0 | 0 | 38 | 760* |
| | | | මුල් සිතියමේ නො. 4,077. | | | | |
| 1 | හපුගහමුලවත්ත .. | — | .. ඩී. වී. ඩිංගිරිඅප්පු විසින් අල්ලාගත්තාලද අවුරුදු 3 සිට 20 දක්වා පමණ වයසැති කොස්, පුවක්, පොල් සහ ගෙයක්ද තාවකාලික මඩුවකින් කොටසක්ද ඇති ඉඩම | 0 | 3 | 21 | 60* |
| 2 | එම .. | — | .. ඩී. වී. ඩිංගිරිඅප්පුට බදුදී තිබෙන අවුරුදු 3 සිට 15 දක්වා පමණ වයසැති පොල් සහ කොස් ඇති ගම්සභාපාර දිගේ වෙන්කර තිබෙන ඉඩම | 0 | 1 | 17 | —† |
| 3 | රතුකොස්ගහමුලවත්ත නොහොත් කිරිවානාකැටිගේවත්ත | — | .. පරුස්සැල්ලේ එච්. ඇම්. මැද්දුමබණ්ඩා කෝරල විසින් අල්ලාගත්තාලද අවුරුදු 10 සිට 20 දක්වා පමණ වයසැති පුවක්, පොල්, කොස් සහ ගෙයක්ද ඇති ඉඩම | 0 | 3 | 19 | 85* |
| 4 | ලිඳගාවාකුඹුර .. | — | .. පරුස්සැල්ලේ එච්. ඇම්. මැද්දුමබණ්ඩා කෝරල සහ කේ. ඩිංගිරිනයිදේ විසින් අල්ලාගත්තාලද කුඹුර | 0 | 1 | 1 | 170* |
| 5 | කිරිවානේකැටිගේලන්ද | — | .. (අත්හැරදමා තිබෙන) තේ ඇති හේන .. | 0 | 1 | 29 | 40 |
| 6 | කිරිවානාකැටිගේවත්ත | — | .. පරුස්සැල්ලේ එච්. ඇම්. මැද්දුමබණ්ඩා කෝරල විසින් අල්ලාගත්තාලද අවුරුදු 2 සිට 15 දක්වා පමණ වයසැති පුවක්, කොස්, පොල් සහ ගෙයක කොටසක්ද ඇති ඉඩම | 1 | 2 | 31 | 70* |
| 7 | කිරිවානාකැටිගේකුඹුරවැල්ල | — | .. එම අය විසින් අල්ලාගත්තාලද කුඹුර .. | 0 | 0 | 30 | 170* |
| 8 | කවුඩුවරකාගොල්ලේ මූකලාන | — | .. යකලවත්තේ ඇලදිගේ වෙන්කර තිබෙන ඝන කැලය | 3 | 2 | 27 | —† |
| | | | මුල් සිතියමේ නො. 4,078. | | | | |
| 1 | හිස්ගහඩින්නේකැලේ | — | .. යකලවත්තේ ඇලදිගේ වෙන්කර තිබෙන ඝන කැලය සහ අඩිපාර | 2 | 0 | 19 | —† |
| 2 | ගනේපල්ලවත්ත .. | — | .. ගනේපල්ලවත්ත අයිතිකාරයන් විසින් අල්ලාගත්තාලද අවුරුදු 25ක් පමණ වයසැති රබර් සහ අඩිපාරක් ඇති ඉඩම | 0 | 3 | 14 | 710* |
| 3 | යකලවත්ත .. | — | .. කිතුල්ගල ඇම්. ජී. ප්‍රේරා විසින් අල්ලාගත්තාලද අවුරුදු 2ක් පමණ වයසැති පොල්ගහක් ඇති ඉඩම | 0 | 0 | 6 | 60* |
| | | | මුල් සිතියමේ නො. 4,115. ගම—පැලැල්ලේගම. | | | | |
| 1 | කිරිහේන් කන්දේ මූකලාන | — | .. මූකලාන .. .. .. | 25 | 3 | 34 | —† |
| 2 | කින්රෙස්වත්ත .. | — | .. කොළඹ සී. එච්. ඉෂෙඩ් ප්‍රනාන්දු මහත්මයා විසින් අල්ලාගත්තාලද අවුරුදු 3 සිට 10 දක්වා පමණ වයසැති රබර් ඉඩම | 0 | 0 | 22 | 260* |
| 3 | එම .. | — | .. එම .. .. | 0 | 0 | 5 | 260* |
| 4 | කින්රෙස්වත්ත .. | — | .. එම අය විසින් අල්ලාගත්තාලද අවුරුදු 4 සිට 10 දක්වා පමණ වයසැති රබර් ඉඩම | 0 | 0 | 25 | 260* |

මුල් සිතියමේ නො. 4,116.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල රු. |
|---|---|---|---|---|---|
| 1 | දේවාලගම්මන .. | — .. | අවුරුදු 50ක් පමණ වයසැති පොල්ගහක්ද, අවුරුදු 3 සිට 7 දක්වා පමණ වයසැති පොල්ගස් 7ක්ද, අවුරුදු 5 සිට 30 දක්වා පමණ වයසැති කොස් සහ පුවක්ද දේවාලයක්ද ඇති ඉඩම | 2 1 38 | —† |
| 2 | දික්දත්තේවත්ත .. | — .. | අයි. ඩබ්ලිව්. ජී. පීටර්සිංඥෝ විසින් අල්ලාගන්නාලද අවුරුදු 1 සිට 8 දක්වා පමණ වයසැති පොල්, කොස් සහ කෙසෙල්ද ඇති ඉඩම | 0 0 30 | 110* |
| 3 | පිටකොටුවේවත්ත .. | — .. | එම අය විසින් අල්ලාගන්නාලද අවුරුදු 10 සිට 15 දක්වා පමණ වයසැති පුවක්, පොල් සහ කොස් ඇති ඉඩම | 0 0 29 | 110* |
| 4 | දේවාලේගාවාවත්ත .. | — .. | එම අය විසින් අල්ලාගන්නාලද අවුරුදු 5 සිට 25 දක්වා වයස පුවක්ගස් ඇති ඉඩම | 0 0 9 | 110* |

* බේරුම්කරදීමට. † විකිණීමට නොවේ.

මෙම ඉඩම් ගැණ වැඩිදුර කාරණ කෑගල්ලේ ආණ්ඩුවේ උප ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වම් 1932ක්වූ ජුනි මස 16වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමිසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. වී. බ්‍රේන්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුව.

---

**No. 10,219, S. O.**—ඉඩම් බේරුම්කරන කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වම් 1932ක්වූ අගෝස්තු මස 17වෙනි දිනවූ බදාදා පෙරවරු 9ට හෝමන් බ්‍රිජ්හිදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ උඩබුලත්ගම කොඨාසයේ අඹකමුව කෝරලේ කොඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 16ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 111. ගම—කදුරේගොඩ.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකම්කියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 4 | පොල්සිවියවත්ත .. | ආණ්ඩුව, කදුරේගොඩගෙදර කුඩාඅප්පුගේ වගාව .. | හේන සහ හේ .. | 0 2 29 |
| 20 | කදුරලගවත්ත .. | ආණ්ඩුව, වල්හේනගේ හෝනිස් සිල්වාගේ වගාව .. | හේ සහිත වත්ත | 0 1 33 |
| 21 | එම .. | එම .. .. .. | එම .. | 2 1 26 |
| 22 | එම .. | එම .. .. .. | හේ .. | 0 0 6 |
| 23 | එම .. | එම .. .. .. | එම .. | 0 0 4 |
| 27 | මල්ලිකාවත්ත .. | ආණ්ඩුව, (1) මස්කෙළියේ ආර්. වී. කේ. කරුපයියා පිල්ලේ, (2) බොගවන්තලාවේ පලනියන්ඩි කන්කානි ඉරේසයියා, (3) එම්ගම කුප්පසාමි කන්කානි, (4) මස්කෙළියේ රාමසාමි පුල්ලේ, (5) වටවල මල්ලිකාවත්තේ පෙරියානන් පුල්ලේ | එම .. | 0 0 28 |
| 31 | හාපිටිතගලගාවහේන්ලන්ද | ආණ්ඩුව, කතිරිනා ප්‍රේරා හාමිනේගේ වගාව .. | එම .. | 0 3 23 |
| 32 | එම .. | ආණ්ඩුව සහ ඇල්ලඋඩ පදිංචි කතිරිනා ප්‍රේරා .. | අඩිපාර සහ ඉතුරු කරපු බිම | 0 0 24* |
| 46 | හාරන්ගස්තැන්නේ වත්ත | ආණ්ඩුව සහ කදුරේගොඩ පදිංචි ඩී. ජී. ලොකුහාමිනේ .. | එම .. | 0 0 25* |
| 47 | එම .. | එම .. .. .. | හේ .. | 0 2 8 |
| 48 | එම .. | එම .. .. .. | එම .. | 0 2 1 |
| 50 | එම .. | ආණ්ඩුව සහ ඇල්ලඋඩ පදිංචි ඩී. ජී. ලොකුහාමිනේ .. | එම .. | 0 2 12 |
| 54 | මල්ලිකාවත්ත .. | ආණ්ඩුව සහ මස්කෙළියේ පදිංචි ආර්. වී. කේ. කරුපයියා පිල්ලේ සහ තවත් | එම .. | 0 0 8 |
| 57 | එම .. | එම .. .. .. | එම .. | 0 3 6 |
| 58 | එම .. | එම .. .. .. | එම .. | 4 0 15 |
| 65 | එම .. | එම .. .. .. | එම .. | 0 3 5 |

* බදුදීමට පමණයි.

අක්කරයක තක්සේරු මිල රුපියල් 100 දක්වාය.

මෙයි ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වම් 1932ක්වූ ජුනි මස 20වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. වී. බ්‍රේන්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුව.

---

**No. 10,220, S. O.**—ඉඩම් බේරුම්කරන කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වම් 1932ක්වූ අගෝස්තු මස 17වෙනි දිනවූ බදාදා පෙරවරු 9ට හෝමන් බ්‍රිජ්හිදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ උඩබුලත්ගම කොඨාසයේ අඹකමුව කෝරලේ කොඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 4ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 109. ගම—අඹතලාව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකම්කියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 14 | අඹගහමුලහේන .. | ආණ්ඩුව, අඹතලාවේවිදානේලාගේ සාරහාමි සහ අප්පුහාමිගේ වගාව | වත්ත .. | 0 0 21 |
| 15 | එම .. | ආණ්ඩුව .. .. .. | පුවක් සහ දෙල් ආදිය සහිත ලඳු කැලය | 0 0 33 |
| 18 | මුලත්වත්ත .. | ආණ්ඩුව, (1) අඹතලාවේවිදානේලාගේ අප්පුහාමි, (2) එම සාරහාමිගේ වගාව | හේ .. | 0 0 25 |
| 23 | මල්ලිකාවත්ත .. | ආණ්ඩුව, ආර්. වී. කේ. කරුප්පයියා පිල්ලේ සහ තවත් අයවරුන්ගේ වගාව | එම .. | 0 0 14 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 100 දක්වාය.

මෙයි ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වම් 1932ක්වූ ජුනි මස 20වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. වී. බ්‍රේන්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුව.

**No. 10,221, S. O.**—ඉඩම් බේරුම් කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1932ක්වූ සැප්තැම්බර් මස 9වෙනි දිනවූ සිකුරාදා පෙරවරු 8.30ට නාරම්මල කානායෙදී වෙන්දේසියක විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල පලාතේ කටුගම්පොලහත්පත්තුවේ මැද්දේකැටියකෝරලේ කොඩාගෙයි පිහිටා තිබෙන බිම් කැබලි 20ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 2,584. ගම—කුරීකොටුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 26 | ඉස්වැටියේවත්ත .. | (1) ඉස්මාලෙබ්බෙබ්ලාගේ ඉබ්රු ලෙබ්බෙ, (2) කාසිලෙබ්බෙලාගේ උදුමා ලෙබ්බෙ, (3) එම අහමදු ලෙබ්බෙ, (4) අබූබක්කර්ලාගේ අයිශාඋම්මා, (5) ඉස්මායිල් | වත්ත | .. 1 | 0 | 9 |
| 33 | ඉස්වැටියේවත්ත .. | අසලනාලෙබ්බෙබ්ලාගේ ඉස්මා ලෙබ්බෙ .. .. | එම | .. 1 | 3 | 31 |
| 35 | වැගොල්ලේපිටියේවත්ත . | පච්චිරතම්බිලාගේ කුන්ජු වාප්පු ලෙබ්බෙ .. | එම | .. 0 | 3 | 5 |
| 36 | මීගහමුලවත්ත .. | ඔමරුලෙබ්බෙබ්ලාගේ අබුබක්කර ලෙබ්බෙ .. | එම | .. 0 | 2 | 34 |
| 37 | ඉස්වැටියේවත්ත .. | අසනාලෙබ්බෙබ්ලාගේ ඉස්මා ලෙබ්බෙ .. .. | එම | .. 0 | 1 | 13 |
| 47 | වෙරළුගහමුලවත්ත .. | (1) සෙකන්දුලාගේ මාරියම් මුනාච්චි, (2) ඉස්මාලෙබ්බෙලාගේ පාතුම්මා | එම | .. 0 | 3 | 29 |
| 53 | මසිලගහමුලවත්ත .. | ඉබ්රුලෙබ්බෙබ්ලාගේ සෙලෙයිමා ලෙබ්බෙ ගන්ආරච්චි .. | එම | .. 1 | 0 | 38 |
| 55 | මසිලගහමුලවත්ත නොහොත් බෝගහමුලවත්ත | එම .. .. .. | එම | .. 2 | 0 | 24 |
| 57 | එම .. | එම .. .. .. | එම | .. 1 | 3 | 4 |
| 62 | කහටගහමුලවත්ත නොහොත් කොල්එතලන ගලගාවවත්ත | උඩයාරලාගේ අසනා ලෙබ්බෙ වෙල්විදානේ .. | එම | .. 0 | 1 | 32 |
| 64 | කීනගහමුලවත්ත නොහොත් වැගොල්ලේ පිටියේවත්ත | ඉබ්රුලෙබ්බෙබ්ලාගේ සෙලෙයිමා ලෙබ්බෙ ගන්ආරච්චි .. | එම | .. 2 | 3 | 9 |
| 72 | වැගොල්ලේපිටියේවත්ත. | සෙලෙයිමාලෙබ්බෙබ්ලාගේ ඉබ්රු ලෙබ්බෙ .. .. | එම | .. 0 | 2 | 20 |
| 73 | එම .. | (1) අහමදුලෙබ්බෙබ්ලාගේ නාචූරා, (2) ඉබ්රුලෙබ්බෙබ්ලාගේ අහමදු ලෙබ්බෙ, (3) අහමදුලෙබ්බෙබ්ලාගේ මොහමදු ඉස්මායිල්, (4) එම සෙල්මාන් ලෙබ්බෙ, (5) එම අයිශාඋම්මා, (6) එම උදුමා ලෙබ්බෙ, (7) එම ඉබ්රු ලෙබ්බෙ, (8) එම මොහමදු ලෙබ්බෙ | එම | .. 0 | 2 | 21 |
| 79 | එම .. | (1) ඉබ්රුලෙබ්බෙබ්ලාගේ අහමදු ලෙබ්බෙ, (2) අහමදුලෙබ්බෙලාගේ මොහමදු ඉස්මායිල්, (3) එම සෙල්මාන් ලෙබ්බෙ, (4) එම මොහමදු ලෙබ්බෙ, (5) එම අයිශාඋම්මා, (6) එම ඉබ්රු ලෙබ්බෙ, (7) එම උදුමා ලෙබ්බෙ | එම | .. 10 | 0 | 29 |
| 80 | වැගොල්ලේපිටියේවත්ත. | ඉබ්රුලෙබ්බෙබ්ලාගේ අහමදු ලෙබ්බෙ .. .. | එම | .. 1 | 1 | 8 |
| 81 | එම .. | (1) ඉස්මාලෙබ්බෙබ්ලාගේ නාචූර් ලෙබ්බෙ, (2) එම කාසි ලෙබ්බෙ, (3) එම අබූබක්කර් | එම | .. 2 | 0 | 34 |
| 82 | එම .. | අදම්පුල්ලේලාගේ මොහමදු ලෙබ්බෙ .. .. | එම | .. 2 | 1 | 31 |
| 85 | මුදලියපිටියේවත්ත .. | (1) හිරුතලාහේකෝරලේ කොටම්බෙපිටියේ පදිංචි අහමදු ලෙබ්බෙබ්ලාගේ ඉස්මා ලෙබ්බෙ, (2) මැද්දේකැටියේ කෝරලේ හිදගොල්ලේ පදිංචි එම පාතුමා, (3) අදම්පුල්ලේලාගේ මොහමදු ලෙබ්බෙ | එම | .. 3 | 3 | 15 |
| 86 | වෙලන්කොල්ලේවත්ත .. | කොළඹ කර්හර් වී. ජී. ජයවර්ධන මහතා, මොල්ලිගොඩ පදිංචි සින්නතම්බිලාගේ තම්බිලෙබ්බෙ විරුධව අයිතිවාසිකම්කියයි | එම | .. 18 | 1 | 10 |
| 87 | එම .. | එම .. .. .. | එම | .. 1 | 0 | 28 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 100 දක්වාය.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරන කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1932ක්වූ ජූනි මස 20වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. වී. බ්‍රෙන්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුව.

---

**No. 10,222, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1932ක්වූ සැප්තැම්බර් මස 10වෙනි දිනවූ සෙනසුරාදා පෙරවරු 8.30ට නාරම්මල කානායමේදී වෙන්දේසියක විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල පලාතේ කටුගම්පොල හත්පත්තුවේ මැද්දේකැටියෙකෝරලේ කොඩාසගෙයි පිහිටා තිබෙන බිම්කැබලි 7ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 2,584. ගම—කුරීකොටුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 88 | වෙලන්ගොල්ලේවත්ත | මොල්ලිගොඩ පදිංචි සින්නතම්බිලාගේ තම්බිලෙබ්බෙ .. | වත්ත | .. 0 | 3 | 2 |
| 90 | මුදලියපිටියේවත්ත .. | (1) උඩයාරලාගේ අසනාලෙබ්බෙ වෙල්විදානේ, (2) අහමදු ලෙබ්බෙබ්ලාගේ අයිශාඋම්මා | එම | .. 0 | 2 | 3 |
| 92 | එම .. | (1) උඩයාරලාගේ අසනාලෙබ්බෙ වෙල්විදානේ, (2) අහමදු ලෙබ්බෙබ්ලාගේ අයිශාඋම්මා, (3) රාජපක්ෂපේඩිදුරයාලාගේ සන්ගා | එම | .. 3 | 1 | 37 |
| 98 | පිංකුඹුරේවත්ත .. | හිදගොල්ලේ පන්සල භාරකාර හොරම්බාවේ හිදගොල්ලේ විහාරේ නිවාසි දිවුල්කුඹුරේ පියරතන උන්නාන්සේ | එම | . 1 | 1 | 25 |
| 99 | වැකන්දපාවුලවත්ත නොහොත් ගලගාව වත්ත | (1) උදුමාලෙබ්බෙගුරුන්නැහෙලාගේ ඔමරු ලෙබ්බෙ, (2) එම යූසුප් ලෙබ්බෙ, (3) අදම්පුල්ලේගුරුන්නැහෙලාගේ නාචූරා උම්මා, (4) එම අහමදු ලෙබ්බෙ, (5) එම පාතුම්මා, (6) උඩයාරලාගේ අසනා ලෙබ්බෙ විදානේ, (7) ඉබ්රුලෙබ්බෙබ්ලාගේ අහමදු ලෙබ්බෙ | එම | .. 1 | 0 | 36 |
| 100 | එම .. | එම .. | එම | .. 1 | 2 | 26 |
| 102 | තෙරඹුගහමුලවත්ත .. | (1) පැන්දෙනිගොඩ පදිංචි අරියාමතලාගේ කාසි ලෙබ්බෙ, (2) බස්නාහිරඋඩුකහකෝරලේ නුගගහගෙදර පදිංචි එම අයිශාඋම්මා | එම | .. 0 | 1 | 15 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 100 දක්වාය.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1932ක්වූ ජූනි මස 20වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. වී. බ්‍රෙන්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුව.

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්බර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, ඒ නම්:—පරිත්තිතුරේ වැඩිමනත් වතුර බැහැයාමට ඇලක් කැපීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ සරතිබෙන පංඩාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසි ආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. 8,313. ගම—පරිත්තිතුරේ සනීපාරක්ෂක සමිතියේ සීමාතුළ පිහිටි නැගෙණහිර පුලෝලි.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | කන්ඩයන්තෙන්නෙ (බද්දු තක්සේරු නො. 74) | තල්වත්ත, අවුරුදු 50කට අධික වයසැති ගස් 2ක් තිබේ | නැගෙණහිර පුලෝලියේ පදිංචි සිතම්පරම් කෝවිල් භාරකාරවරු වන නැසීගිය සෝම සුන්දර කුරුක්කලියේ අඹු වන මංගලම් පිගෛ අම්මාල් සහ ඇස්. පන්චාච්චර කුරුක්කලියේ අඹු වන කමලාම්පිගෛ අම්මාල් | 0 | 0 | 4·97 |
| 2 | කන්ඩයන්තෙන්නෙ (බද්දු තක්සේරු නො. 66) | තල්වත්ත, අවුරුදු 50කට අධික වයසැති ගසක් තිබේ | පරිත්තිතුරේ පදිංචි ගනාම්මෙම ක්‍රිෂ්නෝ .. | 0 | 0 | 5·23 |
| 3 | කන්ඩයන්තෙන්නෙ (බද්දු තක්සේරු නො. 76) | තල්වත්ත, අවුරුදු 50කට අධික වයසැති ගස් 8ක් තිබේ | තුම්පලේ පදිංචි පී. අප්පාතුරේගේ අඹු නාගාත්තෙ සහ කේ. නාගප්පර්ගේ අඹු වන සින්නාච්චි පුල්ලේ | 0 | 0 | 8·76 |
| 4 | කන්ඩයන්තෙන්නෙ (බද්දු තක්සේරු නො. 93) | තල්වත්ත, අවුරුදු 50කට අධික වයසැති ගසක් තිබේ | පරිත්තිතුරේ පදිංචි සිංගාරවේලු විනායගම් .. | 0 | 0 | 3·31 |
| 5 | නාවත්තෙන්නෙ (බද්දු නො. 57) | තල්වත්ත, අවුරුදු 2ක් වයසැති පොල්පැල 2ක් තිබේ | නැගෙණහිර පුලෝලියේ පදිංචි නැසීගිය කේ. සින්නෙනයාගේ අඹු නාගරත්නම් | 0 | 0 | 4·02 |
| 6 | නාවත්තිනි (බද්දු නො. 58) | තල්වත්තක කොටසක් වැව්ලි නැත | නැගෙණහිර පුලෝලියේ පදිංචි ඒ. තිරුනාවුක්කරසු, ඇස්. අරුනාසලම්, නැසීගිය කේ. සින්නෛයියාගේ අඹු නාගරත්නම්, නැසීගිය කන්දයියාගේ අඹු ඉලච්චුමියාර්, වී. වෛරමුත්තු, පී. වෛරමුත්තුගේ දූවන තංගම් | 0 | 0 | 1·30 |
| 7 | නාවත්තිනි (බද්දු නො. 56) | තල්වත්ත, අවුරුදු 50කට අධික වයසැති පොල් ගස් 4ක්ද, තල්ගස් 2ක්ද තිබේ | නැගෙනහිර පුලෝලියේ පදින්චි වී. සින්නතුරේගේ අඹු රාසම්මා සහ කේ. සින්නතම්පිගේ අඹු වන තංගම්මා | 0 | 0 | 10·05 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1932ක්වූ ජූලි මස 19වෙනි දින පෙරවරු 10යේ කාලයමට පරිත්තිතුරේ රෙස්ටාවුසියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවට ඇත්තාවූ තමුන්ගේ අයිතියේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි. ඉඩම්වලට අයිතිවාසිකම් පෙන්වන ඔප්පුද ඉදිරිපත්කරන්ට ඕනෑය.

වර්ෂ 1932ක්වූ ජූනි මස 16වෙනි දින යාපනේ කච්චේරියේදීය.

ඒ. වී. ඩයිසන්,
උ. දි. ආණ්ඩුවේ ඒජන්ත වහන්සේ.

---

## ඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම්.

### 1931යේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතයි.

### නිරවුල්කිරීමේ දැන්වීම නො. 119 (කුරුණෑගල).

මීට යාකර තිබෙන උප ලේඛනයෙහි විස්තරවෙන ඉඩම්වලින් කිසිවක් හෝ ඒ ඉඩම්වල යම්කිසි කොටසක් නොහොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය වර්ෂ 1932ක්වූ ජූනි මස 24වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මෙහි පහත අත්සන්කරන මා වෙත ඉදිරිපත් නොකළොත් එකී ඉඩම රජසන්තක ඉඩමකැයි 1931යේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතේ 5 (1) වන වගන්තිය යටතේ ප්‍රකාශකරණුලබන බවද රජසන්තක ඉඩමක් වශයෙන් ගෙන ඒට කටයුතුකරණ බවද එකී ආඥාපණතේ 4වන වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

වර්ෂ 1932ක්වූ අප්‍රේල් මස 5වෙනි දින කුරුණෑගල කච්චේරියේදීය.

ජේ. ආර්. වෝල්ටර්ස්,
වයඹ දිසාවේ ආණ්ඩුවේ මහ ඒජන්තතැන වහන්සේ.

(a) මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු වයඹ දිසාවේ මහ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වෙයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

(b) මෙකී ඉඩම්වලට නොහොත් එයින් එකකවත් උඩින් යන යම් පාරකට අයිතිකම් කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම්වලට අයිතිකම් කීම හැටියට භාරගනු ලැබේ.

### උප ලේඛනය.

මෙහි පහත සඳහන් බිම්කැබලි වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඋඩපිලිහත්පත්තුවේ කුඩාගල්බොඩකෝරලේ තිත්තවැල්ලේ පිහිටා තිබේ:—

නො. 6,823 දරණ මූල් සිතියම.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. | රූ. | ප. |
|---|---|---|---|---|
| 1 | තිත්තවැල්ලේවැව .. .. | 36 | 3 | 3 |
| 2 | එම .. .. | 5 | 0 | 4 |
| 3 | — .. .. | 0 | 0 | 13 |
| 5 | අත්කිලිපිටිය නොහොත් තිතතවැල්ලේවැව | 2 | 0 | 22 |
| 6 | කනවැදුම්මුල්ලෙවත්ත .. .. | 0 | 0 | 29 |
| 7 | තිත්තවැල්ලේවැව .. .. | 0 | 2 | 15 |
| 8 | එම .. .. | 0 | 2 | 10 |
| 9 | වැවේගල .. .. | 1 | 1 | 24 |
| 10 | ඉහලගමේහේන .. .. | 0 | 3 | 5 |
| | | 47 | 2 | 5 |

මෙහි පහත සඳහන් ඉඩම අස්කර තිබේ.

| | | | | |
|---|---|---|---|---|
| 4 | තිත්තවැල්ලේවත්තේකඩේ .. | 0 | 0 | 5 |

මීට මායිම්—උතුරට ජී. ඒ. කුමංචිනෝනාට අයිති බෝදිලිම කුඹුරද, කුරුණෑගල සිට පුත්තලමට යන ප්‍රසිද්ධ පාරද, යූ. හෙන්ද්‍රික් පෙරේරා උරුමකියන මිත්තයෑවෙලද; නැගෙනහිරට නො. 96,824 දරණ ජුඩිෂල් කොටසක් වන යූ. හෙන්ද්‍රික් සිල්වාට අයිති නො. 6,823 දරණ මූල් සිතියමේ සඳහන් නො. 11 දරණ බිම්කැබැල්ලද, උඩත්තාපොල ගම්ඉමද, ඇම්. ප්‍රැන්සිස් පුල්ලේට අයිති පලාවෙවත්තද, උඩත්තාපොල සහ කලහොගෙදර ගම්ඉම්ද; දකුණට ජෝන් පෙරේරාට අයිති මාවිදලුපොතද, කුරුණෑගල සිට පුත්තලමට යන ප්‍රසිද්ධ පාරද; මාවිදලුපොත ගම්ඉමද, ජෝන් පෙරේරා උරුමකියන දෙමටගහවෙලද; බස්නාහිරට එච්. ඇම්. කිරිබංඩා උරුමකියන පහගිගොල්ලේවත්තද, එච්. ඇම්. කිරිබංඩා සහ තවත් අය උරුමකියන තිත්තවැල්ලේවෙලද, බී. පී. කලුවා උරුමකියන ගලගාවාවත්තද, විහාරේ භාරකාරයෝ උරුමකියන තිත්තවැල්ලේවිහාරයද, ජී. ඒ. කුමංචිනෝනා උරුමකියන බෝදිලිමද වේත්.

---

### 1931යේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතයි.

### නිරවුල්කිරීමේ දැන්වීම නො. 120 (කුරුණෑගල).

මීට යාකර තිබෙන උප ලේඛනයෙහි විස්තරවෙන ඉඩම්වලින් කිසිවක් හෝ ඒ ඉඩම්වල යම් කිසි කොටසක් නොහොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය වර්ෂ 1932ක්වූ ජූනි මස 24වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මෙහි පහත අත්සන්කරන මා වෙත ඉදිරිපත් නොකළොත් එකී ඉඩම රජසන්තක ඉඩමකැයි 1931යේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතේ 5 (1)

වන වගන්තිය යටතේ ප්‍රකාශකරනුලබන බවද රජසන්තක ඉඩමක් විශයෙන් ගෙන ඒව තවශ්‍යතු කරන බවද එකී ආඥා පණතේ 4වන වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

වර්ෂ 1932ක්වූ අප්‍රේල් මස 4වෙනි දින කුරුණෑගල කච්චේරියේදීය.

ජේ. ආර්. වෝල්ටර්ස්,
වයඹ දිසාවේ ආණ්ඩුවේ මහ ඒජන්තතැන වමහ.

(a) මෙම ඉඩම ගැන වැඩිදුර තොරතුරු වයඹ දිසාවේ මහ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

(b) මෙකී ඉඩම්වලට නොහොත් එයින් එකකටවත් උඩින් යන යම් පාරකට අයිතිකම් කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම් වලට අයිතිකම් කීම හැටියට භාරගනු ලැබේ.

උප ලේඛනය.

මෙහි පහත සඳහන් බිම්කැබැල්ල වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේ වැලඹිලිගත්පත්තුවේ කුඩාගල්බොඩකෝරළේ බමුණුස්ස යන ගම පිහිටා තිබේ.

නොම්මර 6,782 දරණ මුල් සිතියම.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 1 | බමුණුස්සේවැව .. | .. 9 3 29 |

මීට මායිම්—උතුරට ඩබ්ලිව්. ඒ. ජලිස්අප්පු උරුමකියන බදලවෙවත්තද, නොම්බර 371,661 දරණ පිඹුරේ සඳහන් උඟුරුවෙල පදිංචි ඇම්. ඒ. දෙන් සාපින් අප්පුහාමිට අයිති මැදබමුනාකොටුවේ බෝගහමුලහේනද; නැගෙණහිරට කේ. බී. ඒබ්‍රහම්සිංඤෝ සහ තවත් අය උරුමකියන කාවල්ලේකුඹුරද, නොම්බර 354,631 දරණ පිඹුරේ සඳහන් අල්ලිස් පෙරේරාගේ උරුමක්කාරයින්ට අයිති කරඹෙවත්තද; දකුණට නොම්බර 4,538 දරණ මුල් සිතියමේ සඳහන් නොම්බර G 118 දරණ ගම්මුන්ට අයිති කරඹෙවත්තද, නොම්බර 354,630 දරණ පිඹුරේ සඳහන් ආර්. ඒ. පබිලිස් පෙරේරාට අයිති කරඹෙවත්තද, නොම්බර 4,538 දරණ මුල් සිතියමේ සඳහන් නොම්බර C 118 දරණ ආණ්ඩුවට අයිති කරඹෙවත්තද; බස්නාහිරට කේ. ඒ. ඩුම්පිසිඤෝ උරුමකියන වෑබොඩෙවත්තද, ආර්. ඇම්. පීරිස්අප්පු උරුමකියන වැබොඩෙවත්තද, ඩබ්ලිව්. ඒ. මන්ගෝහාමි උරුමකියන වැබොඩවත්තද, ඩබ්ලිව්. ඒ. ජූලිස්අප්පු උරුමකියන බදලවෙවත්තද වෙත්.

---

## ටැන්ඩර්ස් නම් ඉල්ලුම්පත්‍ර පිළිබඳ දැන්වීම.

### ආණ්ඩුවේ ඉඩම් සහ ගොඩනැගිලි බදුදීම.

බස්නාහිර පළාතේ දිසාපතිතුමා විසින් මෙහි පහත විස්තර කරණුලබන ආණ්ඩුවේ ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි බදු දීම සඳහා ටැන්ඩර්ස් නොහොත් ඉල්ලුම්පත්‍ර භාරගන්නා බව මෙයින් දැනගත යුතුයි.

2. එකී ටැන්ඩර්ස් නොහොත් ඉල්ලුම්පත්‍ර වර්ෂ 1932ක්වූ ජූලි මස 27වෙනි බදාදා පස්වරු 1 වනතුරු කොළඹ කච්චේරියේදී භාරගෙන එම වෙලාවටම ඒවා කඩා බලනු ලැබේ.

3. ටැන්ඩර්ස් නොහොත් ඉල්ලුම්පත්‍ර එවන්නාවූ සියලු දෙනාම එම ඉල්ලුම්පත්‍ර සැබෑ ඒවා බව දිසාපතිතුමා ඒත්තු ගැණීම පිණිස තමන් හෝ තමන් වෙනුවෙන් කිසි බලයලත් අයෙක් එම වෙලාවට පෙනීසිටින්ට ඕනෑය.

කොන්දේසි.

1. මෙම බද්ද අවුරුදු දහයකට දෙනු ලැබේ.

2. ඉල්ලුම්කාරයෝ විසින් අවුරුද්දපතා ගෙවන්ඩ සූදානම් බදු මුදලද එම ඉඩම සහ ගොඩනැගිලි කුමණ ප්‍රයෝජනයකට හෝ ප්‍රයෝජනවලට යොදනවාද යන බවත් ඉල්ලුම්පත්‍රවල සඳහන්කළ යුතුයි.

3. තෝරාගන්නාලද ඉල්ලුම්කාරයා විසින් හය මාසක බදු මුදල් ඇපයක් වශයෙන් අත්පිට ගෙවිය යුතුයි. තවද ඔහු විසින් තුන් මාසයකට වැටෙන බදු මුදල තුන්මාසයෙන් තුන් මාසය කලින් ගෙවිය යුතුයි. ඇප මුදල් සහ පළමුවෙනි කාර්තුවට ගෙවියයුතු බදු මුදල ගෙවනතුරු ඉඩම සහ ගොඩ නැගිලි භාරදෙනු නොලැබේ.

4. බදුකාරයා විසින් ඉඩම සහ ගොඩනැගිලි යහපත්ලෙස හොඳ පරපේරුවෙන් බස්නාහිර පළාතේ දිසාපතිතුමා හෝ එතුමාගේ බලයලත් අය සතුටුවන අන්දමින් තබාගත යුතුයි. සෑම අය බදු ගෙවීමද නාගරික සභාවේ අණපණත්වලට එකඟව ක්‍රියාකිරීම බදුකාරයාගේ යුතුකම වෙත්.

5. දිසාපතිතුමාට හෝ එතුමාගේ බලය පිට ක්‍රියාකරණ කෙනෙකුට බදුකාරයාට හය මාසයක කල්දීමෙන් එහි භුක්තිය උවමනා අවස්ථාවකදී ආපසු ගතහැක.

6. බස්නාහිර පළාතේ දිසාපතිතුමාගෙන් ලියවිල්ලකින් ලබාගත් අවසරයක් නොමැතිව බදුගත් අය විසින් එකී ඉඩම හෝ ගොඩනැගිලිවල බද්ද වෙන කෙනෙකුට පැවරීම හෝ වෙන බද්දක් දීම තහනම්ය.

7. මෙම ගොඩනැගිලිවලට මොන අන්දමක වෙනස් කිරීමක් බස්නාහිර පළාතේ දිසාපතිතුමාගේ ලියවිල්ලකින් ලබාගන්නාලද අවසරයක් නොමැතිව බදුකාරයා විසින් නොකළ යුතුයි.

8. මෙම ඉඩමේ සහ ගොඩනැගිලිතුළ නාගරික සභාවේ අණපනත්වලට විරුඩ වෙළඳාමක් හෝ වැඩක් නොකළ යුතුයි.

9. බදුකාරයා විසින් මෙම බද්ද අවසානයේදී හෝ ඊට ප්‍රථම බද්ද අවලංගුවේදී බදුගත් ඉඩම සහ ගොඩනැගිලි යහපත්ලෙස හොඳ පරපේරුවෙන් බස්නාහිර පළාතේ දිසාපතිතුමාට හෝ එතුමාගේ බලයලත් අයෙකුට භාරදිය යුතුයි.

10. තෝරාගනුලැබූ ඉල්ලුම්කාරයා ඉල්ලුම්පත්‍ර භාරගෙන මාසයක් තුලදී මතු සඳහන් කොන්දේසි අඩංගු බදුකරයක් අත්සන්කර දෙන්ඩ ඕනෑය.

11. මතු සඳහන් කොන්දේසි බදුකාරයා විසින් කඩකළ හොත් එම බදුකාරයා ඉඩමෙන් සහ ගොඩනැගිලිවලින් කිසි අලාභයක් නොගෙවා අස්කිරීමට බස්නාහිර පළාතේ දිසාපති තුමාට බලය තිබේ.

12. එකම ඉල්ලුම්පත්‍රයක් හෝ සියළුම ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට දිසාපති තුමාට බලය තිබේ.

ආර්. ඇම්. ඇම්. වර්ස්ලි,
බස්නාහිර පළාතේ දිසාපතිතුමා.

වර්ෂ 1932ක්වූ ජූනි මස 21වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

ඉඩමේ සහ ගොඩනැගිලිවල තොරතුරු.

කොළඹ පිටකොටුවේ පිහිටි පරණ නාගරික ශාලාව සහ එම ඉඩම.

බිම් ප්‍රමාණය—රූඩ්ස් දෙකක් පමණ වේ.

මායිම:—

උතුරට: කයිමන්දොරකඩ සහ කෙලින් වීදිය.
දකුණට: නාගරික සභාවේ වෙළඳම්පොල.
නැගෙණහිරට: ගැස්වක් වීදිය.
බස්නාහිරට: පස්වෙනි හරස් වීදිය.

---

### වැලිගම්කෝරළේ ඉබ්බාවල පිහිටි කෘෂිකාර්මික ආදර්ශ ගොවිපලේ රබර් ඉඩම බදුදීම.

1. දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කේ වැලිගම්කෝරළේ ඉබ්බාවල පිහිටුවා තිබෙන කෘෂිකාර්මික ආදර්ශ ගොවිපලේ රබර් වවා තිබෙන අක්කර 2කුත් පර්චස් 30ක් පමණ බිම් තරම ඇති ආණ්ඩුවේ ඉඩම වර්ෂ 1932ක්වූ ජූලි මස 15වෙනිදා සිට 1932ක්වූ දෙසැම්බර් මස 31වෙනිදා දක්වා මාස $5\frac{1}{2}$කට බදුදීම සඳහා ඉල්ලුම්පත්‍ර මාතර උප ඒජන්ත උන්නාන්සේ භාරගන්නා බව මෙයින් දැනුම්දෙනු ලැබේ.

2. කවරවල දමා සීල්කරනලද ඉල්ලුම්පත්‍ර මාතර කච්චේරියේදී වර්ෂ 1932ක්වූ ජූලි මස 11වෙනි සඳුදා පෙරවරු 11 දක්වා භාරගනු ලැබේ. කවරවල පිට වම්පැත්තේ "ඉබ්බාවල පිහිටා තිබෙන කෘෂිකාර්මික ආදර්ශ ගොවිපලේ රබර් වවා තිබෙන ඉඩමේ බද්ද ඉල්ලීම" කියා ලියා එවිය යුතුයි. ඉහතකී වේලාවේදී ඉල්ලුම්පත්‍ර ගලවා බලනවිට ඉල්ලුම්කරුවන් හෝ ඔවුන් වෙනුවෙන් පෙනීසිටින්ට නිසිආකාර පත්කරනුලැබූ වෙන අයවලුන් හෝ ඉල්ලුම්පත්‍ර සැබෑ ඒවා හැටියට පෙන්වීමට මාතර උප ඒජන්ත උන්නාන්සේ ඉදිරිපිට පෙනීසිටින්ට ඕනෑය.

3. ඉහාමත් වැඩි ගණනට ඉල්ලූ අය බදුකාරයා හැටියට තෝරාගනුලැබූ වහාම ඔහු විසින් සම්පූර්ණ බදු මුදල කච්චේරියේ තැන්පත්කරන්ට ඕනෑය.

4. බදුකාරයා ඉඩමේ තිබෙන රබර්ගස්වල ප්‍රයෝජනය පමණක් ගෙන රබර්ගස්වලට යෑමට ගම්මිරිස් වවන්ට ඔහුට අවසර තිබේ. ඔහුට එකී ඉඩමේ යම්කිසි අලුත් ස්ථිර වැටිල්ලක් කිරීමටවත් කිසි ගොඩනැගිල්ලක් සෑදීමටවත් බලයක් නැත. රබර්ගස්වල කිරිකැපීම දවසක් හැර දවසක් කිරි ගන්නා ක්‍රමයට කළයුතුය. රබර්ගස් අතර තාවකාලික එලවලු වගාද වවන්ට පුළුවන.

5. බදුකාරයා හෝ ඔහුගේ මෙහෙකරුවන් මෙකී ඉඩමේ පිහිටි මොනයම් ගසක්වත් කපන්ට හෝ ඊට කිසියම් අනතුරක් කරන්ටද පිට අයවලුන් විසින් එසේ කැපීමට හෝ අනතුරු කිරීමට ඉඩහැරීමද යුතුනැතුවා පමණක්නොව ඉඩමේ තිබෙන මායිම් වැටවල් හා යම්කිසි ගොඩනැගිලි ආදියට අනතුරුදායක කිසිවක් කළයුතු නොවේ.

6. උප ඒජන්ත උන්නාන්සේ අනකළවිටක එකී ඉඩමේ වැටවල් බැඳ ඒවා නිසිආකාර අලුත්වැඩියාකර තැබීමට බදුකාරයා බැඳෙන්ට ඕනෑය.

7. බදුකාරයා ඉඩමෙන් ප්‍රංචි පැලෑටි අහක්කර ඉඩම සුබ පවිත්‍ර ලෙස යහපත් ආකාරයෙන් තබන්ට ඕනෑය. තණ කෑවීම පිණිස ගවයන් ඉඩම තුළට ගැනීම තහනම්ය.

8. මාතර උප ඒජන්ත උන්නාන්සේට හෝ උන්නාන්සේ විසින් පත්කර තුලැබූ කිසිවෙකුට හෝ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහ කැලෑ දෙපාර්තමේන්තුවට අයත් නිලධාරීන්ට හෝ උවමනාවූ විටක බදුකාලය අතරතුරේදී දහවල් කාලයෙහි ඉඩමට පැමිණෙන්ට බදුකාරයා විසින් ඉඩ ඇරිය යුතුය.

9. මාතර උප ඒජන්ත උන්නාන්සේගේ අවසරය ඇති ලියවිල්ලක් නැතුව බදුකාරයා විසින් ඔහුගේ බද්දේ අයිතිවාසිකම් වෙන අයෙකුට පැවරීම හෝ සින්නක්කර කිරීම හෝ අනගවදීම යුතු නැත.

10. ඉඩමේ බද්ද අවසානවෙන්ට ප්‍රථම සම්පූර්ණ ඉඩම හෝ ඉන් යම් කොටසක් හෝ ආණ්ඩුවට උවමනාවුනිනම් ඒ බව මාසයකට කලින් දැනුම්දුන්විට බදුකාරයා ඒ උවමනා ප්‍රමාණය ආණ්ඩුවට භාරදෙන්ට ඕනෑය. බදු මුදලෙන් අවුරුද්දේ ඉතිරි කොටසට සම ප්‍රමාණ මුදලක් ඒ වෙනුවෙන් බදුකාරයාට ආපසු දෙනුලැබේ.

11. මේ ඉඩමේ මිණිරන් හෑරීමේද, මැණික් හෑරීමේද, ගල් පස් ආදිය කැඩීමේද බලය ආණ්ඩුවට තබාගනුලැබේ.

12. බදුකාලය ඉකුත්වූ වහාම හෝ යම් අන්දමකින් බද්ද අවලංගුකළ වහාම බදුකාරයා එකී ඉඩම මාතර උප ඒජන්ත උන්නාන්සේ විසින් අණකරන කෙනෙකුට උපද්‍රව රහිතව නිසිආකාර භාරදෙන්ට ඕනෑය.

13. බදුකාරයා ඉහත සඳහන් යම් කොන්දේසියක් කඩ කළොත් බද්ද අවලංගුකොට බදුකාරයා සහ ඔහුගේ මෙහෙකරුවන් ඉඩමෙන් අස්කොට ඉඩමට සහ වැවිල්ලට කළ කිසි දියුණුවකට හෝ බදුකාරයා විසින් කළ වියහියදමකට හෝ ඔහුට සිදුවූ අලාභයකට හෝ කිසිම වන්දි මුදලක් ආණ්ඩුවෙන් නොගෙවා වැවිල්ල සහිත ඉඩම නැවත ආණ්ඩුවේ අත්අඩංගුවට ගැනීමට මාතර උප ඒජන්ත උන්නාන්සේට බලය තිබේ.

14. මාතර උප ඒජන්ත උන්නාන්සේ සතුටුවන පරිදි එකී ඉඩමේ ගම්මිරිස් වවා සශ්‍රිකකොට එහි වැවිල්ල මනාසේ තැබුවොත් එහි බද්ද 1933න් අවුරුද්දට එම බදුකාරයාටම සෑහෙන බදුමුදලකට දීමට කල්පනාකරනු ලැබේ.

15. යම් ඉල්ලුම්පත්‍රයක් හෝ සියලුම ඉල්ලුම්පත්‍ර කිසිම වගවිභාගයක් නැතුව ප්‍රතික්ෂේපකිරීමට උප ඒජන්ත උන්නාන්සේට බලය තිබේ.

16. තෝරාගනුලැබූ ඉල්ලුම්කාරයා වර්ෂ 1932ක්වූ ජූලි මස 15වෙනි දින සිට මාස 5½ක බද්දට අවසරපත්‍රය වහාමයන් G. A. C. 144 දරණ පෝර්මයකාලයක අත්සන්තැබිය යුතුයි.

17. මේ සම්බන්ධව වැඩිදුර කාරණා උප ඒජන්ත උන්නාන්සේගෙන් මාතර කච්චේරියේදී දැනගතහැක.

එච්. ජේ. ඇල්. ලිංකලයාර්,
උප ඒජන්ත වර්ග.

වර්ෂ 1932ක්වූ ජූනි මස 20වෙනි දින
මාතර කච්චේරියේදීය.

---

### ඉඩම් සශ්‍රිකකිරීමේ දැන්වීමයි.

### මාතර දිස්ත්‍රික්කය.

මෙහි පහත සඳහන්වන ගම්වල තිබෙන එක්තරා ඉඩම් වගයක් ඉල්ලාඑවන ඉල්ලුම්පත්‍ර මාතර ආණ්ඩුවේ උප දිසාපතිතැන විසින් වර්ෂ 1932ක්වූ අගෝස්තු මස 16වෙනි දින පෙරවරු 10ට අකුරැස්සේ කානායක්පලෙහි පවත්වන ඉඩම් කච්චේරියේදී පරීක්ෂාකොට කල්පනාවට ගන්නාබව මෙයින් දැනුම්දෙනු ලැබේ. ඉගතකී ඉඩම් සම්බන්ධ වැඩි විස්තර කරුණු මාතර කච්චේරියෙන් හෝ ගාල්ලේ මිනින්දෝරු කන්තෝරුවෙන් හෝ කොළඹ සර්වේයර් ජනරල් කන්තෝරුවෙන් හෝ අසා දැනගත හැකිය.

2. ඉල්ලුම්කරන්නට සතුටූ අය ඔවුන් ඉල්ලුම්කරන්නට අදහස්කරන ඉඩම පිහිටි ප්‍රදේශය හා ඒ ඉඩමේ ප්‍රමාණයද, ඉඩම ලැබුනොත් එහි දමන්නට අදහස්කර සිටින වැවිල්ලද සඳහන්කොට ඉල්ලුම්පත්‍රයක් ලියා වර්ෂ 1932ක්වූ ජූලි මස 25වෙනි දිනදී හෝ ඊට මත්තෙන් උප දිසාපතිතැන වෙත යැවිය යුතුයි. ඔවුන්ට දැනට අයිති හෝ ආණ්ඩුවෙන් බද්දට ගෙන භුක්තිවිඳින සියලු ඉඩම්වල ප්‍රමාණයද පිහිටීමද සඳහන්කිරීම වුවමනා කෙරේ. යම් ඉල්ලුම්කරුවකු විසින් එබඳු ප්‍රමාණය ගැන වැරදි නොහොත් අසම්පූර්ණ යමක් කියා තිබුනොත් ඒ ඉල්ලුම්කරුට වෙන්කරණලද යම් ඉඩමක් ඔහුට දීම මාතර උප දිසාපතිතුමාගේ කල්පනාව අනුව අවලංගුකරත හැකිය. ඉල්ලුම්පත්‍රය සමග ඒ සඳහා මුදලක් බැඳීම වුවමනා නැත. ඉල්ලුම්කරුවන් තම ඉල්ලුම්පත්‍ර පිළිබඳ වැඩිමනත් කරුණු උප දිසාපතිතැනට කියාදෙනු පිණිස ඉඩම් කච්චේරියට පැමිණිය යුතුයි. ඉල්ලුම්කරු හෝ ඔහු වෙනුවෙන් පෙනීසිටීමට ලියවිල්ලකින් බලයදුන් අන්කෙනෙක් ඉඩම් කච්චේරියට නොපැමිණියේනම් ඔහු කම ඉල්ලීම අත්හැරදමූ හැටියට උප දිසාපතිතැන සලකනවා ඇත.

3. මේ ඉඩම් ලැබෙන්නේ මුළුමනින් අක්කර 50කට අඩුවෙන් තමන්ට අයිති හෝ ආණ්ඩුවෙන් බදුගත් ඉඩම් තිබෙන ලාංකිකයන්ට පමණයි. එසේ දෙන ඉඩම් අක්කර 50ත් 50ටත් අතරේ කට්ටි වේ.

4. ඉඩම් හිතුමනාපයට අත්සන්තක නොකළහැකි වීමද, ණයට තහනම්කිරීමට ඉඩ නොලැබී ආරක්ෂාවීමද කුඩා කොටස්වලට බෙදීම හෝ බෝනෝදෙනකු අතරේ පොදුවේ භුක්තිවිඳීම වැළකීමද, ඉඩම යහපත් ප්‍රයෝජන ඇති කටයුත්තකට යෙදීමද ඉෂ්ටවනලෙස පොරොන්දු ඇතිව භුක්තිවිඳින හැටියට දෙනුලැබේ. මෙවැනි භුක්තියක් පිළිබඳවූ ආඥාණකත් පණවාගත් වහාම, ඉඩම ඒ ආඥාපණතේ වගන්තිවලට යටහත් කරනු ලැබේ.

5. ඉඩම් කවම පුංචි කට්ටිවලට කඩා මැන නැත්නම් එසේ මනිනතුරු ස්වල්ප මාස ගණනකට ඒවා තීර වශයෙන් බෙදාදීම කල්දමනු ලැබේ.

6. ඉඩම්කට්ටි ලැබීම හෝ ඊට වැන්ඩර්පත්‍ර දැමීම හෝ සඳහා තෝරනුලැබූ ඉල්ලුම්කරුවන්ට අක්කරයකට රුපියල් තුන බැගින් මිනින්දෝරු ගාස්තු බඳිනලෙස නියමකරනු ලැබේ. ඉල්ලුම්කරු විසින් කළයුතු යමක් නොකිරීම හෝ නොකළයුතු යමක් කිරීම නිසා නුවුවමනා මැනීමක් ගැන ආණ්ඩුවට වියදම් දරන්නට සිදුවුනිනම් ඒ මුදල ආපසු දෙනු නොලැබේ. යම්කිසි ඉල්ලුම්පත්‍රයක් සම්බන්ධයෙන් මේ ගාස්තු ආපසු දීම සෑහේද නැද්ද යන ප්‍රශ්නය පිළිබඳව ඉඩම් කොමසාරිස්තැනගේ තීරණය අවසාන තීරණය වේ.

7. තෝරනලද ඉඩම් දීම ගැන උප දිසාපතිතැන නියම කළ දිනදී ඉල්ලුම්කරුවන්ට කරණයක් නැතුව හෝ තම තමා අතරේ වැන්ඩර්පත්‍ර දමා හෝ උප දිසාපතිතැන නියම කරන අන්දමකට ඉඩම්කට්ටි දෙනහැකිය.

සී. වී. බ්‍රෙන්.
ඉඩම් කොමසාරිස් තැන.

### දීමට තිබෙන ඉඩම්වල විස්තර.

| ගම. | | සාමාන්‍ය උස ප්‍රමාණය අඩි. | | ගමෙන් දීමට තිබෙන බිම් ප්‍රමාණය අක්කර. |
|---|---|---|---|---|
| ගොරකාවෙල | .. | 500 | .. | 10 |
| මතුගොඩ | .. | 2,450 | .. | 84 |
| ඒදන්බූකිත | .. | 1,000 | .. | 250 |
| උවරගිල | .. | 750 | .. | 85 |
| දියලපේ | .. | 250 | .. | 104 |
| මලිදූව | .. | 350 | .. | 212 |
| රත්වාගොඩ | .. | 200 | .. | 73 |
| පරපාමුල්ල | .. | 350 | .. | 120 |
| කෙහෙල්වල | .. | 350 | .. | 22 |
| කලහගම | .. | 200 | .. | 136 |
| දෙරන්ගල | .. | 650 | .. | 550 |

---

## උපාධ්‍යා නීති.

### වර්ෂ 1896යේ අංක 13 දරන ආඥාපණත.

වර්ෂ 1897යේ අංක 7 දරන ආඥාපණතෙන් අමුතුකරන්ට යෙදුන වතුහා ගමන් පිළිබඳ ආඥාපණතයයි නම්ලත් ආඥාපණතේ අංක 1 දරන වගන්තියේ ප්‍රකාර 1932යේදී දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ දෙවුන්දර ශ්‍රී විෂ්ණු මහා දේවාලයේ පවත්වන්ට අදහස්කර තිබෙන පෙරහැර මඩුලාය සිරිත් ප්‍රකාර පවතියයි යන අදහසින් ලංකාණ්ඩුකාර උතුමාණන්වහන්සේ වෙත 1931යේ ලංකාවේ රාජ්‍යමන්ත්‍රණ සභාවේ අංක 93 දරන නියෝගයෙන් එතුමාණන්වහන්සේට ලැබී තිබෙන බලය ප්‍රකාර පනවනලද නියෝගයයි.

ඩී. බී. ජයතිලක,
අභ්‍යන්තර කාර්යභාරකාර මන්ත්‍රීතුමා.

වර්ෂ 1932ක්වූ ජූලි මස 21වෙනි දින කොළඹ
අභ්‍යන්තර කාර්යභාරකාර මන්ත්‍රීතුමාගේ
කන්තෝරුවේදීය.

### දෙවුන්දර ශ්‍රී විෂ්ණු මහා දේවාලයේ පෙරහැර මඩුලාය.

### 1896යේ අංක 13 දරන වතුහා ගමන් පිළිබඳ ආඥාපණත යටතේ සම්පාදනයකරනලද ව්‍යවස්ථා.

1. දෙවුන්දර ශ්‍රී විෂ්ණු මහා දේවාලයට පෙරහැර මඩුලාය සඳහා යන වතුනාකාරයන්ට දෙවුන්දර නැවතී සිටීමට අවසර ඇති කාලය දෙසලාස් දවසකි; එනම්, 1932යේ ජූලි මස 14වන දින පටන් එම මස 25වන දින දක්වා පමණකි.

මූලින් කී දිනට මත්තෙන් පැමිණෙන්නාවූ හෝ මෙහි නියම කළ කාලයට වඩා නතරවන්නාවූ වන්දනාකාරයෝ වරදක් කිරීම ගැන වැරදිකාරයෝ වෙත්.

2. පෙරහැර කාලයේදී හෝ ඊට කලින් දෙවුන්දර හෝ ඊ අසල බෝවෙන, පැතිරෙන නොහොත් වසංගත ස්වභාවයේ යම් රෝගයක් පටන්ගත්තොත් නැත්නම් උප දිසාපති තුමාගේ කල්පනාවේ හැටියට වන්දනාකාලයේදී දෙවුන්දරට පැතිර එන්නට පූර්වයන් දකුණු පළාතේ වෙනයම් ස්ථානයක එබඳු රෝගයක් පවතීනම් වන්දනාගමන නතරකරන්නට හෝ පෙරහැර කාලය අවසානවූයේයයි ප්‍රකාශකරන්නටද දෙවුන්දරට පිවිස ඇවිත්සිටි සියල්ලන්ටම වහාම ඉන් පිටවී තමතමන්ගේ ගම්වලට හැරී යන්නට නියමකරන්නටද ඔවුන් යායුතු මාර්ග මේ මේයයි නියමකරන්නටද උප දිසාපතිතුමාට නීති ප්‍රකාර බලය තිබේ. උප දිසාපතිතුමාගේ අණ නොසලකන යමෙක් ඇද්ද හෙතෙම වරදක්කිරීම ගැන වරදකාරයෙක් වේ.

3. බෝවෙන නොහොත් පැතිරෙන රෝගයකින් පෙළෙමින් ඒ බව වහාම සනීපාරක්ෂක පරීක්ෂකතැනට හෝ වෛද්‍ය මූලාදෑනිතැනට හෝ ඔවුන් නැතිවිට, දෙවුන්දර සිටින පොලිසියේ මූලාදෑනින් අතුරෙන් උසස් මූලාදෑනියාට හෝ නොදන්වා සිටින යමෙක් ඇද්ද, තවද එබඳු රෝගයක් පවතින බැව් වසංකරගැනීමට අනුබලදෙන්නාවූ හෝ ආධාරකරන්නාවූ යමෙක් ඇද්ද එබඳු අය අපරාධයක්කිරීම ගැන වරදකාරයෙක් වේ.

4. පෙරහැර මඞ්ගල්‍යය පවතිනා අතර මස් මාලු හෝ එළවලු විකිණීම පිණිස උප දිසාපතිතුමා විසින් හෝ සනීපාරක්ෂක සභාවේ ප්‍රධානතැන විසින් හෝ වෙන්කොට තබා තිබෙන ස්ථානයේ හැර දෙවුන්දර වෙන කිසියම්තැනක ඒ ද්‍රව්‍ය යමෙක් විකුණන්නේද, සනීපාරක්ෂා පරීක්ෂකතැන විසින් හෝ වෛද්‍ය මූලාදෑනිතැන විසින් හෝ ඔවුන් නැතිවිට මුදලිතැන විසින් හෝ දෙවුන්දර සිටින පොලිසියේ මූලාදෑනින් අතුරෙන් උසස් මූලාදෑනියා විසින් හෝ කෑමට නුසුදුසු යයි කියන මසක් හෝ කිසියම් ආහාරපානාදියක් යමෙක් විකුණන්නේද එබඳු අය අපරාධයක් කිරීම ගැන වරදකාරයෙක් වේ.

5. පෙරහැර මඞ්ගල්‍යය පවතිනාතර දෙවුන්දර විකිණීමට තබන සියලුම කැවුම්, රසකැවිලි හා අනිකුදු ආහාර ද්‍රව්‍ය මනාසේ සාදනලද වීදුරු පෙට්ටිවල හෝ මැස්සන්ට ඇතුල් විය නොහැකි වෙන භාජනවල තබාගත යුතුයි. එබඳු සියලුම භාජන පවිත්‍රව තබාගත යුතුවේ.

6. උප දිසාපතිතුමා විසින් හෝ සනීපාරක්ෂක සභාවේ ප්‍රධානතැන විසින් මැනවැයි පිළිගන්නාලද ස්ථානයක එසේ පිළිගන්නාලද ආකාරයකට සෑහෙන වැසිකිළි පහසු තැනීම ගැන පෙරහැර මඞ්ගල්‍යය පවත්වන භූමිය අයිතිකාරයා හෝ (එය බද්දට දී තිබේනම්) බදුකාරයා වගකිය යුත්තේය. එබඳු වැසිකිළි පෙරහැර මඞ්ගල්‍යය පවත්වන මුළු කාලයට පවතින්ට සෑහෙන අන්දමට තිබිය යුතුයි. ඒවායේ සැලැස්මවල් (ප්ලෑන්) හා විස්තර උප දිසාපතිතුමාගේ හෝ සනීපාරක්ෂක සභාවේ ප්‍රධානතැනගේ අනුමතය ලබාගැනීම පිණිස පෙරහැර පටන්ගන්නට දසදිනකටවත් මත්තෙන් යැවිය යුතුයි. ඒ ඇරත් කොහුබත් හෝ වැලිද උප දිසාපතිතුමා විසින් මැනවැයි පිළිගත් වගීඝ්‍රක රෝග විෂබීජ නසන බෙහෙත්ද සම්පාදනය කිරීම ගැන හා පෙරහැර මඞ්ගල්‍යය පවත්වන තෙක් දවසකට දෙවරක්වත් අශුචි ඉවත්කිරීම හා වැසිකිළි ශුද්ධකිරීම ගැනද හෙතෙම වගකිය යුත්තේය. අයිතිකාරයා හෝ බදුකාරයා මෙම නියෝගයේ විධිවිධානවලින් යමක් කඩකළේනම් හෙතෙම අපරාධයක්කිරීම ගැන වරදකාරයෙක් වේ.

7. උප දිසාපතිතුමා විසින් හෝ සනීපාරක්ෂක සභාව විසින් හෝ පෙරහැර මඞ්ගල්‍යය පවත්වන භූමිය අයිතිකාරයා විසින් හෝ බදුකාරයා විසින් හෝ ශරීරකෘත්‍යයන් සඳහා වෙන්කොට තිබෙන ස්ථාන හැර වෙන කිසියම් ස්ථානයක් පෙරහැර මඞ්ගල්‍යය පවත්වන කාලයේදී පාවිච්චිකරන්නාවූ හෝ පහ රනලද අශුචි පස්වලින් හෝ වැලිවලින් වසානොදමන්නාවූ යමෙක් ඇද්ද හෙතෙම අපරාධයක්කිරීම ගැන වරදකාරයෙක් වේ.

8. සියලුම පිදුරු, කැළිකසල, ගොම හෝ වෙනයම් රොඩු ආදිය පෙරහැර මඞ්ගල්‍යය පවත්වන අතර දිනපතා වරක් වත් එකතුකොට ඉවත්කිරීමද, එබඳු කැළිකසල රොඩු ආදිය උප දිසාපතිතුමා විසින් හෝ සනීපාරක්ෂක සභාවේ ප්‍රධානතැන විසින් මැනවැයි පිළිගන්නාලද ස්ථානයක පුලුස්සාදැමීම හෝ වළලාදැමීම පෙරහැර මඞ්ගල්‍යය පවත්වන භූමිය අයිතිකාරයාට හෝ (එය බද්දට දී තිබේනම්) බදුකාරයාට භාර වැඩකි. මෙම නියෝගයේ විධිවිධානවලින් යමක් නොකොට හෝ නොකරවා පැහැරඅරින යම්කිසි අයිතිකාරයෙක් හෝ බදුකාරයෙක් ඇද්ද හෙතෙම අපරාධයක් කිරීම ගැන වරදකාරයෙක් වේ.

9. මාතර සිට හංගල්ලට යන මහපාරේ සහ දේවාලේට යන පාරේ-කානුවේ පටන් අඩි 12ක් ඇතුළත බිමේ පෙරහැර මඞ්ගල්‍යය පිළිබඳව කඩමඩුවක් හෝ වෙනයම් ගොඩනැගිල්ලක් දෙවුන්දර නොසෑදිය යුතුයි. තවද වෙළඳාම්බඩු මැස්සක් තබාගත් යම්කිසි කෙනෙකු, වෙළෙන්දකු හෝ මිලට විකුණන්නකු එබඳු බිම ඇතුළත විකිණීම පිණිස බඩු තබාගෙන සිටිය යුතුනැත. මේ නියෝගය කඩකරන යමෙක් ඇද්ද හෙතෙම අපරාධයක්කිරීම ගැන වරදකාරයෙක් වේ.

10. රථවාහනාදිය නැවීමට හෝ මඞ්ගල්‍යය බලන්නට එන්නන්ගේ ඉඩ පහසුවට මාතර උප දිසාපතිතුමා විසින් වෙන්කර තිබෙන යම් බිම්කොටසක් ඇද්ද දෙවුන්දර එබඳු ස්ථානයේ කඩ මඩුවක් හෝ වෙනයම් ගොඩනැගිල්ලක් තැනියයුතු නොවේ. යම් කිසිවෙක් මේ නියෝගයේ විධිවිධාන කඩකළේනම් හෙතෙම අපරාධයක්කිරීම ගැන වරදකාරයෙක් වේ.

---

## දැන්වීමයි.

### තලවිල්ලුවෙහි ජූලයි මස පවත්වන සන්ත අන මංගල්‍ය සම්බන්ධවයි.

ඉහත සඳහන් මංගල්‍ය කාලය තුළ ටොන් ($2\frac{1}{2}$) දෙකහමාරකට (මගීන් සහ බඩුත් සමග) වැඩි බර ඇති මෝටර් රථ පාලාවී කල්පිටි පාරේ දිවීම තහනම් බව මෙයින් දන්වමි.

පී. ඥානප්‍රගාසම්,
උප ඒජන්තතුමා වෙනුවට.

---

## සුප්‍රීම් උසාවියේ දැන්වීම.

ශ්‍රී ලංකාවිපයේ ගරුකටයුතු උතුම්වූ සුප්‍රීම් උසාවියෙන් මට ලැබීතිබෙන ආඥාවක බලය කරණකොටගෙණ මෙයින් ප්‍රකාශකරන්නේනම් රත්නපුර දිසාවේ ක්‍රිමිනෙල් නඩු විභාගය වර්ෂ 1932ක්වූ ජූලි මස 11වෙනි දින පෙරවරු 11 පැය පටන් කොළඹ අර්ත්සංබි තිබෙන නඩුසාලාවේ පවත්වන්ට යොදනවා ඇත. එහි යම් කාරණ ඇතුව සිටින සෑමදෙනාම යටකී ස්ථානයට යටකී වෙලාවට ඇවිත් පෙණීසිටින්ට ඕනෑවත් ඇර අවසර ඉල්ලා ලබාගෙණ මිස එයින් පිටතට යන්ට නුපුළුවන් බවත් මෙයින් සෑමදෙනාටම දන්වන්නෙමි.

සී. එච්. කොලින්ස්,
ස. දි. පිස්කල් වමින.

වර්ෂ 1932ක්වූ ජූනි මස 13වෙනි දින
රත්නපුරේ පිස්කල් කන්තෝරුවේදීය.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.